දෙපාර්තමේන්තු චක්‍ර ලේඛ අංක .....07/..2020

මගේ අංක :-බන්ධ/බුද්ධි/නියෝග/01
බන්ධනාගාර බුද්ධි ඒකකය
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09
2020.01.20 වන දින

සියළුම බන්ධනාගාර කොමසාරිස්වරුන්,
ජ්‍යෙෂ්ඨ අධිකාරීන්,අධිකාරීන් සහ සහකාර අධිකාරීන් වෙත,

<u>බන්ධනාගාර බුද්ධි ඒකකය ස්ථාපිත කිරීම හා එම ඒකකය වෙත බලතල පැවරීම</u>

බන්ධනාගාර බුද්ධි ඒකකය පිහිටුවීම සඳහා අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් යොමු කරණ ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට 2019.07.19 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබාදී ඇත.

ඒ අනුව මෙම ඒකකයේ නිලධාරීන් වෙත පැවරෙන රාජකාරීන් හා බලතල මේ සමග ඉදිරිපත් කර ඇති අතර,ඔවුන් වෙත පැවරෙන රාජකාරි කටයුතු ස්වාධීනව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සලසන ලෙසට මෙයින් දන්වමි.

01. බන්ධනාගාර බුද්ධි ඒකකයට අනුයුක්තව රාජකාරි පැවරූ ඕනෑම නිලධාරියෙකුට /නිලධාරීන්ට පෙර දැනුම් දීමකින් තොරව දිවයිනේ පිහිටි ඕනෑම බන්ධනාගාර ආයතනයක දිවා හෝ රාත්‍රී කාලයේ ඇතුළුවී බන්ධනාගාර පරිශ්‍රය තුල ඕනෑම ස්ථානයක් හා ඕනෑම රැදවියෙකු හෝ නිලධාරියෙකු පූර්ණ සෝදිසියකට ලක් කිරීම සිදු කළ හැකිය.සෝදිසිය සඳහා පැමිණෙන නිලධාරීන්ට කිසිදු ප්‍රමාදයකින් තොරව අනන්‍යතාව තහවුරු කරගෙන බන්ධනාගාර පරිශ්‍රය තුලට ඇතුළුවීමට කටයුතු සලසා දීම අදාල ආයතනයේ අධිකාරි විසින් සිදු කළ යුතුය.

02. දිවයිනේ ඕනෑම බන්ධනාගාර පරිශ්‍රයක් තුලට ඇතුළු වන සියළුම නිලධාරීන්,රැදවියන්,අමුත්තන්, වාහන හා සියළුම භාණ්ඩ,සෝදිසි කිරීම සඳහා මෙම නිලධාරීන්ට රාජකාරි බලතල ඇත.

03. බන්ධනාගාර රැදවියන් හා නිලධාරීන් පිළිබඳව බුද්ධි තොරතුරු රැස් කිරීම,විශ්ලේශණය කිරීම,ඒවා වාර්තා කිරීමේ බලතල බන්ධනාගාර බුද්ධි ඒකකය වෙත පැවරී ඇත.

04. අනෙකුත් රාජ්‍ය බුද්ධි අංශයන් සමග සම්බන්ධ වී තොරතුරු ලබා ගැනීමත්,ඒ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමත්,මෙම අංශයේ නිලධාරීන් වෙත පැවරී ඇත.

05. නම ගිය පාතාල අපරාධ කරුවන්, මත් ද්‍රව්‍ය ජාවාරම් කරුවන්, ආරක්ෂණය කිරීමේදී අවශ්‍යතාවය අනුව ආරක්ෂාව සැපයීම සඳහා බුද්ධි අංශයේ නිලධාරීන් යෙදවීම සිදු කරනු ඇත.

06. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ හෝ බන්ධනාගාර කොමසාරිස් (බුද්ධි) ගේ අනුමැතිය මත අවශ්‍ය අවස්ථාවලදී බුද්ධි ඒකකයේ නිලධාරීන් සිවිල් ඇඳුමින් තොරතුරු රැස් කිරීම සඳහා අවශ්‍ය ස්ථානවලට යෙදවීම සිදු කරනු ලබයි.

07. රැදවියන් අධිකරණ වලට රැගෙන ගොස් ඇති අවස්ථාවල එම ස්ථානයේ බන්ධනාගාර නිලධාරීන්ගේ හා රැදවියන්ගේ කටයුතු පරික්ෂා කිරීම.

08. බන්ධනාගාර නිලධාරීන් හා රැදවියන් පිළිබඳව රැස්කල බුද්ධි තොරතුරු අවශ්‍යතාවය අනුව ක්‍රියා මාර්ග ගැනීම සඳහා බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත හා ආයතන ප්‍රධානීන් වෙත යොමු කිරීම සිදු කරනු ඇත.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්,
බන්ධනාගාර මූලස්ථානය

වී.එම්.ජේ.ඩබ්ලිව්. තෙන්නකෝන්
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.